65590

OL/2024(2025)/40/S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**40 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)**
**General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)**

**සංගීතය (පෙරදිග) I, II**
சங்கீதம் (கீழைத்தேய) I, II
**Music (Oriental) I, II**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## සංගීතය (පෙරදිග) I

**උපදෙස්:**

- ✳ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✳ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
- ✳ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- ✳ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** සගමරි, රිමපග, _ _ _ _ ආකෘතිය අනුව යෙදෙන ආරෝහණ ස්වර අභ්‍යාසයේ ඊළඟට යෙදෙන හිස් තැනට අදාළ ස්වර හතර තෝරන්න.
(1) ග ම ධ ප  (2) ග ධ ප ම  (3) ග ප ධ ම  (4) ග ධ ම ප

**2.** ශුද්ධ ස්වර පමණක් යෙදෙන රාග යුගලය අයත් වරණය තෝරන්න.
(1) කාෆි – යමන්  (2) යමන් – භූපාලි  (3) භූපාලි – බිලාවල්  (4) බිලාවල් – යමන්

**3.** ගාන්ධාරය වාදී ලෙස හෝ සංවාදී ලෙස හෝ යොදා ගැනෙන රාග ඇතුළත් වරණය තෝරන්න.
(1) කාෆි, යමන්, භූපාලි  (2) යමන්, භූපාලි, බිලාවල්
(3) බිලාවල්, යමන්, භෛරවී  (4) භෛරවී, භූපාලි, යමන්

**4.** සම්පූර්ණ ජාතියට අයත් **නො වන** රාගය තෝරන්න.
(1) යමන්  (2) කාෆි  (3) භෛරවී  (4) භූපාලි

**5.** ගාන සමය නිශ්චිත ව ම සමාන වන රාග දෙක සඳහන් වරණය තෝරන්න.
(1) යමන් – කාෆි  (2) කාෆි – බිලාවල්  (3) බිලාවල් – භූපාලි  (4) භූපාලි – යමන්

**6.** ගාන්ධාරය සහ ධෛවතය යන ස්වර දෙකම විකෘති ව යෙදෙන රාගය තෝරන්න.
(1) කාෆි  (2) යමන්  (3) භෛරවී  (4) භූපාලි

**7.** රාග අංගයක් ලෙස " ප ප ස් " වශයෙන් ස්වර සංගතිය යෙදෙන අවස්ථා පෙන්නුම් **නො කරන** රාගය තෝරන්න.
(1) යමන්  (2) භූපාලි  (3) බිලාවල්  (4) කාෆි

**8.** ෂඩ්ජ ස්වරය **නො යෙදෙන** ලෙස (ෂඩ්ජයට පෙර හා පසු ස්වර සම්බන්ධ වන අයුරින්) රාග සංගති යෙදෙන රාගය තෝරන්න.
(1) බිලාවල්  (2) භෛරවී  (3) යමන්  (4) කාෆි

**9.** අන්තරා කොටස්වල බොහෝ විට පංචම ස්වරය අත හැර සංගති භාවිත වන රාග දෙකක් ඇතුළත් වරණය තෝරන්න.
(1) භෛරවී – කාෆි  (2) කාෆි – බිලාවල්  (3) බිලාවල් – යමන්  (4) යමන් – භෛරවී

[දෙවෙනි පිටුව බලන්න

10. කාෆි රාගයට නිර්දේශිත මුඛ්‍යාංගය පෙන්නුම් කෙරෙන වරණය තෝරන්න.
(1) සස, රිරි, ගුගු, සරිප
(2) සස, රිරි, ගුගු, මමප
(3) රිගු, රිම, ගුරි, සරිප
(4) රිනි, ධනි, පධ, මමප

● අංක **11** සහ **12** හි සඳහන් ප්‍රශ්න සඳහා පහත ස්වර ප්‍රස්තාරය ඇසුරින් පිළිතුරු සපයන්න.

| සං– ධප ගප | ධනි සං– සං– ධප | ගප ධනි සං– | සං– ධප ගප ධනි | සං |
|---|---|---|---|---|
| x | 2 | 0 | 3 | x |

11. ස්වර ප්‍රස්තාරයෙහි සඳහන් තිහායි කොටස අයත් රාගය වන්නේ කුමක් ද?
(1) භූපාලි (2) බිලාවල් (3) යමන් (4) කාෆි

12. එම තිහායි කොටස යෙදී ඇත්තේ
(1) ජප්තාලයට අනුව ය.
(2) ත්‍රිතාලයට අනුව ය.
(3) දීප්චන්දි තාලයට අනුව ය.
(4) කෙහෙර්වා තාලයට අනුව ය.

13. ඉගන ත්‍රිට ධා– වශයෙන් යෙදෙන අවනද්ධාක්ෂර පෙළ තෙවරක් වැයීමෙන්, එක් ආවර්තයක් තුළ තිහායි කොටසක් ලෙස ඉයාදා ගත හැකි වන්නේ කුමන තාලයට අනුව ද?
(1) ජප් තාලයට (2) දාදරා තාලයට (3) කෙහෙර්වා තාලයට (4) දීප්චන්දි තාලයට

14. 'ත' සහ 'තිං' යන අවනද්ධාක්ෂර දෙවර්ගය ම ඇතුළත් තාල යුගලයක් සහිත වරණය තෝරන්න.
(1) දීප්චන්දි – ත්‍රිතාල් (2) ත්‍රිතාල් – ජප් (3) ජප්– දාදරා (4) දාදරා – දීප්චන්දි

15. දැතින් ම උපදවන අවනද්ධාක්ෂර සංඛ්‍යාව සහ තනි අතින් උපදවන අවනද්ධාක්ෂර සංඛ්‍යාව සමාන වන තාලයකි, දාදරා. ඒ සඳහා තවත් නිදර්ශනයක් ලෙස පෙන්නුම් කළ හැකි තාලයකි,
(1) කෙහෙර්වා. (2) දීප්චන්දි. (3) ජප්. (4) ත්‍රිතාල්.

16. පහත වාද්‍ය භාණ්ඩ අතුරින් හින්දුස්තානි සංගීතයට ආවේණික භාණ්ඩය තෝරන්න.
(1) සිතාරය
(2) ගිටාරය
(3) පියානෝව
(4) පන්තේරුව

17. ස්වර මාලිකා නමින් හඳුන්වනු ලබන රාගධාරී ප්‍රබන්ධ විශේෂය වන්නේ කුමක් ද?
(1) ධූන් (2) ගත් (3) ඛ්‍යාල් (4) සර්ගම්

18. රාගාශ්‍රිත සරල ගී හඳුනා ගැනීමට ප්‍රධාන වශයෙන් ඉවහල් වනුයේ, නාද මාලාවෙන් පිළිබිඹු වන
(1) ස්වර විශේෂයන් ය.
(2) ස්වර සංගතීන් ය.
(3) ස්වර සීමාවන් ය.
(4) ස්වර පරාසයන් ය.

19. ජන ගී තනු නාද රටා ආශ්‍රිත ව නිර්මාණය වූ "මල්සරා බැල්ම හෙලා" යන සරල ගීතයේ පදරචනය හා තනුව නිර්මාණය කරන ලද්දේ
(1) ලයනල් රන්වල විසින් ය.
(2) සී. ද. එස්. කුලතිලක විසින් ය.
(3) රෝහණ බැද්දගේ විසින් ය.
(4) වික්ටර් රත්නායක විසින් ය.

20. උකුසා වන්නමේ නාද මාලාව පාදක කර ගනිමින්, නිර්මාණය වූ සරල ගීතයට අදාළ ගී පාදය තෝරන්න.
(1) සැඳෑ කළුවර කුරගගා විත්
(2) රුක් අත්තන මල මුදුනේ
(3) තෙදිනි විරාජ කඳ දෙව්රාජ
(4) ආදරයේ උල්පත වූ අම්මා

21. පහත දැක්වෙන ගී පාද අයත් ජන ගී අතුරෙන්, අනාසාතාත්මක ව ගැයෙන ගීතයට අදාළ ගී පාදය තෝරන්න.
(1) බුද්ධං සරණේ සිරස දරා ගෙන
(2) දොඩම් කපාලා ඇඹුල් තනාලා
(3) සීත ගඟුලෙ දී ඇඳ පේවෙනවා
(4) කළුවන් කළුරුවයි මංගෝ දිලිසෙනවා

[තුන්වෙනි පිටුව බලන්න

**22.** ● සේවිත පාද සරෝරුහ සන්චිතයෙන් ඉතා
● කොහොවී යනා හඬ නගනා මියුරු මනා දන සවනා

ඉහත වන්නම් ගායනය සඳහා සාම්ප්‍රදායික ව යොදා ගනු ලබන ප්‍රධාන අවනද්ධ භාණ්ඩ පිළිවෙළින් දක්වෙන වරණය තෝරන්න.

(1) දවුල සහ ගැටබෙරය
(2) ගැටබෙරය සහ දවුල
(3) පහතරට බෙරය සහ දවුල
(4) දවුල සහ පහතරට බෙරය

**23.** පැරණි නාඩගම් ගීතයක් වන "මෙමගින් ගිය රුසිරු එ තරුණා" නම් ගී තනුවට සමාන ලෙස නිර්මාණය වී ඇති "රුසිරු ළඳුනි" නම් ගීතය ඇතුළත් නව නාට්‍ය වනුයේ

(1) මනමේ ය.
(2) සිංහබාහු ය.
(3) කාලගෝල ය.
(4) පේමතෝ ජායතී සෝකෝ ය.

**24.** නාඩගම් ගීතවල උරුට්ටුව සුවිශේෂී අංගයක් වන අතර නුර්ති ගීතවල යෙදෙන සුවිශේෂී අංගයක් වන්නේ,

(1) තෝඩායමයි.
(2) ඉන්නිසයයි.
(3) දොහොරාවයි.
(4) තර්ගයයි.

**25.** කවි ආකෘතිය අනුව පද යෙදී ඇති ගීතයක් සඳහා නිදසුනක් ලෙස සැලකිය හැකි ගීතය අයත් ගී පාදය තෝරන්න.

(1) පියාණනි මා නැවත උපන්නොත්
(2) දුනුකෙයියා මලක් වගේ දුරට පෙනෙනවා
(3) බුද්ධානුභාවේන සිත් නෙත් පහන් වී
(4) ආදරයේ උල්පත වූ අම්මා

**26.** සුප්‍රසිද්ධ ඉන්දීය චිත්‍රපට සංගීත අධ්‍යක්ෂවරයෙකු වන්නේ මින් කවුරුන් ද?

(1) ඒ.ආර්. රහුමාන්
(2) ඒ.ජේ. කරීම්
(3) විශ්වනාත් ලව්ජි
(4) ඒ.එම්.යූ. රාජ්

**27.** රේඛාව චිත්‍රපටය සඳහා දායක වූ ගී පද හා ගී තනු නිර්මාණකරුවන්ගේ නම් සඳහන් වරණය තෝරන්න.

(1) හර්බට් ඇම්. සෙනෙවිරත්න සහ ටී.එම්. ලතීෆ්
(2) පී.කේ.ඩී. සෙනෙවිරත්න සහ සිසිර සේනාරත්න
(3) මර්සලින් ජයකොඩි පියතුමා සහ සුනිල් සාන්ත
(4) ආනන්ද සමරකෝන් සහ බී.එස්. පෙරේරා

**28.** "ගලන ගඟකි ජීවිතේ, පිපී පිපී රේණු නටන ..." යන ගීත ඇතුළත් චිත්‍රපටය වන්නේ,

(1) සැඩ සුළං ය.
(2) ගැටවරයෝ ය.
(3) සත් සමුදුර ය.
(4) රන් මුතු දූව ය.

**29.** හින්දි ගී තනු අනුකරණයෙන් නිර්මාණය වී ඇති ග්‍රැමෆෝන් ගීතයක් සඳහන් වරණය තෝරන්න.

(1) පිට දීප දේශ ජය ගත්තා
(2) දුල් සල් වනේ ලකල්
(3) මව් පියෝ ආදී
(4) එන්ඩ ද මැණිකේ

**30.** බෙංගාලි ජන ගී නාද මාලා ආශ්‍රයෙන් ගීත නිර්මාණය කළ සුවිශේෂී සංගීතඥයා කවුරුන් ද?

(1) ආනන්ද සමරකෝන්
(2) සරත් දසනායක
(3) ප්‍රේමසිරි කේමදාස
(4) ලයනල් රන්වල

**31.** බටහිර සංගීතයේ Key Signature නම් සංකේතයෙන් අදහස් කෙරෙනුයේ

(1) අපරදිග සංගීත ප්‍රස්තාරයක ඇතුළත් විරාම ලකුණු වේ.
(2) අපරදිග සංගීත ප්‍රස්තාරයේ තාල ලකුණු වේ.
(3) අපරදිග සංගීත ප්‍රස්තාරයේ ස්කේලය හැඟවීම වේ.
(4) මන්ද්‍ර, මධ්‍ය, උච්ච වශයෙන් අපරදිග සංගීත ප්‍රස්තාරය අයත් සප්තකය නම් කිරීම වේ.

**32.** අපරදිග සංගීත ප්‍රස්තාරයක මාත්‍රා දෙකක් නිශ්ශබ්ද බව පෙන්නුම් කිරීම සඳහා යොදා ගනු ලබන සංකේතය හැඳින්වෙනුයේ

(1) සෙමිබ්‍රීව් රෙස්ට් නමින් ය.
(2) මිනිම් රෙස්ට් නමින් ය.
(3) ක්‍රොචට් රෙස්ට් නමින් ය.
(4) ක්වේවර් රෙස්ට් නමින් ය.

**33.** බටහිර ස්වර සංඝාත (chords) වාදනය **නො වන** වාද්‍ය භාණ්ඩය තෝරන්න.
(1) කොන්සර්ට් ෆ්ලුට් (2) මැන්ඩලින් (3) පියානෝ (4) ගිටාර්

**34.** F මේජර් ස්කේලයට අයත් ෆ්ලැට් (Flat) ස්වර සංඛ්‍යාව
(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි.

**35.** D මේජර් ස්කේලයට අයත් ෂාප් (Sharp) ස්වර සංඛ්‍යාව
(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි.

**36.** සාම්ප්‍රදායික භාණ්ඩ භාවිතයෙන් තොරව, පරිගණකය හා යතුරු පුවරුව ආශ්‍රයෙන් විද්‍යුත් ක්‍රමයට සංගීතය සැකසීමේ තාක්ෂණය හඳුන් වන්නේ
(1) Wikipedia නමිනි. (2) MIDI නමිනි.
(3) Encyclopedia නමිනි. (4) Encarta නමිනි.

**37.** සංගීතය ගබඩා කර ගත හැකි උපකරණ අතුරෙන් නවතම තාක්ෂණික උපකරණය ලෙස සැලකිය හැක්කේ,
(1) ඩිජිටල් ඕඩියෝ ටේප් (Digital Audio Tape) ය.
(2) පූල් ටේප් (Pool Tape) ය.
(3) ඕඩියෝ කැසට් ටේප් (Audio Cassette Tape) ය.
(4) USB ෆ්ලෑෂ් ඩ්‍රයිව් (USB Flash Drive) ය.

**38.** තබ්ලා වාදනයේ දී දහිනාවෙහි (දායාං) සයාහි කොටස භාවිතයෙන් උපදවනු ලබන අවනද්ධාක්ෂරය තෝරන්න.
(1) ති (2) න (3) ග (4) ක

**39.** දෑත ම භාවිත කරමින් කෝර්ඩ්ස් සහ ගීතයේ නාද මාලාව එක වර වාදනය සිදු කෙරෙන බැලෝ සහිත වාද්‍ය භාණ්ඩය වන්නේ
(1) පියානෝවයි. (2) මවුත් ඕගනයයි.
(3) එකෝඩියනයයි. (4) මෙලෝඩිකාවයි.

**40.** සමාන හැඩයකින් යුත් භාණ්ඩ යුගලයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ගැට බෙරය සහ උඩැක්කිය (2) තම්මැට්ටම සහ ඩෝලය
(3) දවුල සහ මද්දලය (4) මද්දලය සහ මෘදංගය

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**40 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

| | |
|---|---|
| **සංගීතය (පෙරදිග)** | **I, II** |
| சங்கீதம் (கீழைத்தேய) | I, II |
| Music (Oriental) | I, II |

## සංගීතය (පෙරදිග) II

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* සියලු ම ප්‍රශ්න සඳහා ලකුණු 12 බැගින් හිමි වේ.

**1.** අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(i) ග රි නි රි ස, ප රි ස , ලෙස යෙදෙන ස්වර සංගති අයත් වන රාගය නම් කරන්න.

(ii) විකෘති ස්වර හතරක් යෙදෙන නිර්දේශිත රාගය නම් කරන්න.

(iii) ඖඩව ජාති රාගයක යෙදෙන අනුවාදී ස්වර ගණන කීය ද?

(iv) | සරි ප– මප ධනි | ධප මප නිනි ස– | මෙම තානාලංකාරය අයත් නිර්දේශිත රාගය නම් කරන්න.

- අංක (v) සිට (viii) තෙක් ඇති ප්‍රශ්න යටතේ යෙදී ඇති හිස් තැන් සඳහා නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(v) කෝරල් සිම්ෆනිය ........................ නමැති සංගීතඥයා විසින් නිර්මාණය කර ඇත.

(vi) පහත රට සින්දු වන්නම කොටස් හතරකට බෙදී ඇත්තේ බෙර පදය, තානම, කවිය හා .................... වශයෙනි.

(vii) "නැති බැරි මොහොතක පිහිටට එන්නේ" යනාදි වශයෙන් පද යෙදෙන සරල ගීතය ගායනා කරන ලද්දේ ............................ සූරීන් විසිනි.

(viii) එක්ටැම්ගේ චිත්‍රපටියේ එන 'උන්මාද සිතුවම්' ගීතයට ගී තනු නිර්මාණය කර සංගීත අධ්‍යක්ෂණය කර ඇත්තේ ........................ සූරීන් විසිනි.

(ලකුණු 01 × 08 = 08 යි)

- අංක (ix) සහ (x) ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(ix) මුල් යුගයේ ගුවන් විදුලි සරල ගී ලෙස සලකනු ලබන "ඕලු පිපීලා වෙල ලෙල දෙනවා" ගීතය (a) .......................... සූරීන් විසින් ද "කරුණා නදියේ පැද යාමු" ගීතය (b) ............................ සූරීන් විසින් ද නිර්මාණය කරන ලදී.

(x) 'තැර ඉස්ති තැර' වශයෙන් පද යෙදෙන ගීතය ගායනයේ දී තාල වාදනය සඳහා බොංගෝ, ටැම්බරින් හා (a) ........................ යනාදි භාණ්ඩ යොදා ගෙන ඇති අතර, එම ගීතය සඳහා හින්දුස්තානි තාලයක් වන (b) ...................... තාලය ද සුදුසු වේ.

(ලකුණු 02 × 02 = 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

[හයවැනි පිටුව බලන්න

**2.** (i) පහත A, B, C සහ D අක්ෂර යටතෙහි සඳහන් රාග සංගතිවලින් පිළිබිඹු වන හින්දුස්තානි රාග හතර තෝරා අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග වෙන වෙන ම ලියන්න.

A – ස,රිගරිමගරිස

B – මගසරිස,ධනිස

C – ගරිසධ,ධසරිග

D – මගමරි, ගමරිස

(ලකුණු 04 යි)

(ii) ඉහත සංගතිවලින් පිළිබිඹු වන නිර්දේශිත රාග හතරෙන්, ඔබ කැමති රාගයකින්, **පහත එක් වර්ගයකට අදාළ ව ස්ථායි කොටසෙහි** ස්වර ප්‍රස්තාරය නියමිත තාල සංකේත ද සහිත ව ලියන්න.

- මධ්‍යලය බ්‍යාල් ගීතය
- මධ්‍යලය ගත් වාදිතය
- රාග ලක්ෂණ ගීතය
- සර්ගම් ප්‍රබන්ධය

(ලකුණු 05 යි)

(iii) ඉහත A, B, C හා D ස්වර සංගතිවලට අදාළ ව (ii) කොටසට පිළිතුරු ලිවීම සඳහා තෝරා ගත් රාගය හැර ඉතිරි රාග තුනෙහි **අන්තරා කොටස් සඳහා** අදාළ රාග සංගති **තුනක්** වෙන වෙන ම අදාළ රාගයේ නම ද සහිත ව ලියා දක්වන්න. (ලකුණු 03 යි)

**(මුළු ලකුණු 12 යි)**

**3.** (i) පහත A, B, C, D සහ E අක්ෂර යටතෙහි සඳහන් කරුණුවලින් පිළිබිඹු වන නිර්දේශිත රාග පහ තෝරා අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සහිත ව නම් කරන්න.

A – සියලුම ස්වර ශුද්ධ ව යෙදෙන කල්‍යාණ මේලගත රාගයකි.

B – සියලුම ස්වර ශුද්ධ ව යෙදෙන උදය කාලයේ ගැයෙන රාගයකි.

C – චල ස්වර පහෙන් එක් ස්වරයක් පමණක් ප්‍රකෘති ව යෙදෙන රාගයකි.

D – අචල ස්වර වාදි සහ සංවාදි ලෙස යෙදෙන රාගයකි.

E – ගාන්ධාරය සහ නිෂාදය පිළිවෙලින් වාදි සහ සංවාදි ලෙස යෙදෙන රාගයකි. (ලකුණු 05 යි)

(ii) ඉහත A, B, C, D සහ E කරුණුවලින් පිළිබිඹු වන රාග පහෙන් **කැමති රාගයක් තෝරා ගෙන** මධ්‍යලය, බ්‍යාල් ප්‍රබන්ධයක අන්තරා කොටසෙහි පළමු පාදය (එක් ආවර්තයකට අනුව) ස්වර ප්‍රස්තාර කර, එම රාගයට අදාළ ව **මාත්‍රා 8කට නො අඩු තානාලංකාර දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) ජප්තාලයෙහි ඨේකාව නියමිත මාත්‍රා විභාග අනුව තාල සංකේත ද සහිත ව සමලයෙන් යුතු ව ප්‍රස්තාර කරන්න. (ලකුණු 03 යි)

**(මුළු ලකුණු 12 යි)**

**4.** (i) ගැමි ගී නිර්මාණයට පාදක වූ හේතු සාධක **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) අනාසාතාත්මක මෙහෙ ගීවල සුවිශේෂ ලක්ෂණ **තුනක්** ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(iii) විවිධ විරිත් අනුව රචනා වී ඇති ගුත්තිල කාව්‍යයේ එන පහත සඳහන් ගී පාද, මාත්‍රා අනුව නම් කරන ආකාරය වරහන් තුළින් තෝරා ලියන්න.

(දසමත් පැදි, දොළොස්මත් පැදි, සොළොස්මත් පැදි, දසඅටමත් පැදි, විසිඅටමත් පැදි)

- මනමත් කරවන දනමුළු දෙරණා
- රූ රුසේ අදිනා ලෙසේ අත් ලෙල දිදී විදුලිය පබා
- රැගත් සුරා පිරූ විතින්

(ලකුණු 03 යි)

(iv) සිංහල අලුත් අවුරුදු සමයේ දී කෙරෙන ක්‍රීඩා අතුරෙන් ගෘහස්ත ව කෙරෙන ක්‍රීඩාවක් නම් කර, එයට අදාළ ගී පාදයක් පද ප්‍රස්තාර කර, එහි තිත ද නම් කරන්න. (ලකුණු 03 යි)

**(මුළු ලකුණු 12 යි)**

/හත්වැනි පිටුව බලන්න

**5.** (i) සොකරි රංග ශෛලිය සඳහා යොදා ගනු ලබන අවනද්ධ වාද්‍ය භාණ්ඩ **දෙකක්** නම් කරන්න.

(ලකුණු 02 යි)

(ii) නාඩගම් සඳහා භාවිත කරන ලද අවනද්ධ වාද්‍ය භාණ්ඩය සහ නාඩගම් තාලයක් නම් කරන්න.

(ලකුණු 02 යි)

(iii) නුර්ති සඳහා භාවිත කෙරෙන ස්වර වාද්‍ය භාණ්ඩ **දෙකක්** හා අවනද්ධ වාද්‍ය භාණ්ඩයක් නම් කරන්න.

(ලකුණු 03 යි)

(iv) පහත දැක්වෙනුයේ මෙරට නව නාට්‍ය ගී පාද ඇතුළත් අසම්පූර්ණ වගුවකි. එම ගීත අයත් වන නාට්‍යවල නම් සහ එම නාට්‍ය නිෂ්පාදකයින්ගේ නම්, අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග ලියන්න.

| **නව නාට්‍ය ගී පාද** | **නව නාට්‍යය** | **නාට්‍ය නිෂ්පාදක** |
|---|---|---|
| මෑ වේ මං දුටු කොමල ලියා | (a) ............................ | එදිරිවීර සරච්චන්ද්‍ර |
| අම්බරයේ සඳ සේ දිලේ | (b) ............................ | (d) ............................ |
| වගුරට නරුනිඳු දඹදිව පරසිදු | (c) ............................ | (e) ............................ |

(ලකුණු 05 යි)

**(මුළු ලකුණු 12 යි)**



**6.** (i) පහත දක්වෙන අපරදිග සංගීත ප්‍රස්තාර කොටස පෙරදිග සංගීත ප්‍රස්තාර ක්‍රමයට පෙරළා නැවත ප්‍රස්තාර කර එහි එක් එක් විභාගයට සුදුසු කෝඩ්ස් (chords) විභාගවලට පහළින් සඳහන් කරන්න. (අපරදිග 'C' ස්වරය පෙරදිග 'ස' ස්වරයට සමාන යැයි සලකන්න.)



(ප්‍රස්තාරයේ එක් විභාගයකට ලකුණු ½ බැගින් විභාග 8 × ½) (ලකුණු 04 යි)

(කෝඩ්ස් නම් කිරීමට එක් විභාගයකට ලකුණු ½ බැගින් විභාග 8 × ½) (ලකුණු 04 යි)

(ii) පහත වගුවේ (i) කොටසෙහි A සිට D දක්වා ඇති පෙරදිග ස්වර ප්‍රස්තාර කොටස් සඳහා **ගැළපෙන** අපරදිග ප්‍රස්තාර කොටස්, (ii) කොටසින් තෝරා ගෙන ඊට හිමි අංකය අදාළ ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියෙන් ලියා දක්වන්න.

| **(i) කොටස** | **(ii) කොටස** |
|---|---|
| **A** ග – – ප – – / ධ – ස̇ නි ස̇ – | **1**  |
| **B** + ගප නි ස̇නි / ර̇ර̇ ස̇ ග̇ර̇ ස̇ | **2**  |
| **C** ස̇ ර̇ ස̇ නි ස̇ නි / ධ නි ධ ප – – | **3**  |
| **D** ස ම – / – ම ග | **4**  |

(ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

[අටවැනි පිටුව බලන්න

**7.** පහත සඳහන් ප්‍රශ්න අතුරෙන් ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.

(i) තාරතාවය, විපුලතාවය සහ ධ්වනි ගුණය යන නාදයේ ත්‍රිවිධ ගුණ, භාරතීය සංගීත සම්ප්‍රදාය අනුව නම් කර ඇති ආකාරය ලියා, ඉන් **එක්** ගුණයක් පිළිබඳ ව උදාහරණ දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) හරිප්‍රසාද් චෞරසියා, ශකීර් හුසේන් හා රවිශංකර් යන ඉන්දීය සංගීත ශිල්පීන් අතුරෙන් **එක් අයෙකුගේ** ජීවන තොරතුරු හා වාදන කෞශල්‍යය පිළිබඳ කෙටි ඇගයීමක් කරන්න.

(iii) Multi Track Recording සඳහා යොදා ගත හැකි මෘදුකාංග **දෙකක්** නම් කර, ගීතයක් පටිගත කළ හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) ආසාතාත්මක ජන ගීවල සුවිශේෂ ලක්ෂණ **දෙකක්** ලියා නිර්දේශිත ආසාතාත්මක බැති ගීයක පළමු හා දෙවන පාද ලියා දක්වන්න.

(v) පහත ගී පද රචනාව සඳහා සුදුසු නිර්දේශිත රාගයක් ඇසුරින් තනුවක් නිර්මාණය කර, ප්‍රස්තාර කරන්න.

"සිත් ගත් පැහැයෙන් දන මන බැන්දූ
වන කොමළිය සිරි ලක නම රැන්දූ"

**(ලකුණු 04 × 03 = 12 යි)**

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024(2025)

# 40 - සංගීතය (පෙරදිග)

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024(2025)

## 40 - සංගීතය (පෙරදිග)

## ලකුණු දීමේ පටිපාටිය

I පත්‍රයට - 1 × 40 = 40

II පත්‍රයට - පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුයි .

- එක් ප්‍රශ්නයකට ලකුණු 12 × 05 = 60

0607000188110024

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024(2025)
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................................
............................................................ √ △ $\frac{4}{5}$
............................................................

(ii) ............................................................
............................................................ √ △ $\frac{3}{5}$
............................................................

(iii) ............................................................
............................................................ √ △ $\frac{3}{5}$
............................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ — එකතුව → □ $\frac{10}{15}$

## බහුවරණ උත්තරපත්‍ර :

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.

II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.

III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.

IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.

V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.

**VI. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

සැ.යු :- **(I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

05070001881100024

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍යපෙළ පෙළ ) විභාගය - 2024(2025)

## 40 - සංගීතය පෙරදිග

## එක් එක් ප්‍රශ්න පත්‍රයේ ලකුණු ප්‍රදානය කිරීම පිළිබඳ සාරාංශය

සංගීතය (පෙරදිග) i

- මෙම ප්‍රශ්න පත්‍රයේ බහුවරණ ප්‍රශ්න 40 කි.
- ලකුණ 1 බැගින් මුළු ලකුණු 40 කි.

### සංගීතය (පෙරදිග) ii

මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 7 කි. ඉන් පළමු ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම අනිවාර්යය වන අතර එම ප්‍රශ්නයද ඇතුළුව තෝරා ගත් ප්‍රශ්න 05 ක් සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් මුළු ලකුණු ගණන 60 කි.

### සංගීතය (පෙරදිග) ii

1 වන ප්‍රශ්නය

| | | |
|---|---|---|
| i. | ලකුණු 01 | |
| ii. | ලකුණු 01 | |
| iii. | ලකුණු 01 | |
| iv. | ලකුණු 01 | |
| v. | ලකුණු 01 | |
| vi. | ලකුණු 01 | |
| vii. | ලකුණු 01 | |
| viii. | ලකුණු 01 | |
| ix. | ලකුණු 02 | |
| x. | ලකුණු 02 | මුළු ලකුණු 12 යි. |

2 වන ප්‍රශ්නය

i. ලකුණු 04

ii. ලකුණු 05

iii. ලකුණු 03 මුළු ලකුණු 12 යි.

3 වන ප්‍රශ්නය

i. ලකුණු 05

ii. ලකුණු 04

iii. ලකුණු 03 මුළු ලකුණු 12 යි.

4 වන ප්‍රශ්නය

i. ලකුණු 03

ii. ලකුණු 03

iii. ලකුණු 03

iv. ලකුණු 03 මුළු ලකුණු 12 යි.

5 වන ප්‍රශ්නය

i. ලකුණු 02

ii. ලකුණු 02

iii. ලකුණු 03

iv. ලකුණු 05 මුළු ලකුණු 12 යි.

6 වන ප්‍රශ්නය

i. ලකුණු 04

ii. ලකුණු 04

iii. ලකුණු 04 මුළු ලකුණු 12 යි.

04070000188110024

7 වන ප්‍රශ්නය

❖ තෝරා ගත් මාතෘකා තුනට ලකුණු 4 × 3 = 12 ක් හිමි වේ.

මුළු ලකුණු 12 යි.

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2024 (2025)

40 - සංගීතය පෙරදිග - i

අභිමතාර්ථ

1. ස්වර අභ්‍යාසයක ආරෝහණ ක්‍රමයේ තුන්වන පියවර ගොඩනගයි.
2. ශුද්ධ කෝමලාදි ස්වර ප්‍රභේද අනුව රාග හඳුනා ගැනීමේ දක්ෂතාවය පෙන්වයි.
3. වාදි සංවාදි ස්වර සංකල්පය මත රාග හඳුනා ගනියි.
4. රාග ජාතියට අනුකූලව රාගය තෝරයි.
5. රාග ගාන සමය පිළිබඳ අවබෝධය පෙන්නුම් කරයි.
6. ස්වරයන්ගේ ප්‍රකෘති විකෘති ප්‍රභේදය මත රාග හඳුනා ගනියි.
7. රාග ස්වර සංගතීන් අනුව රාගය නිවැරදි ලෙස හඳුනා ගනියි.
8. රාග ස්වර සංගතීන් අනුව රාගය නිවැරදි ලෙස හඳුනා ගනියි.
9. රාග ස්වර සංගතීන් අනුව රාගය නිවැරදි ලෙස හඳුනා ගනියි.
10. රාග මුඛ්‍යාංග සංකල්පය අනුව රාග නිවැරදිව හඳුනා ගනියි.
11. ස්වර ප්‍රස්තාරයේ තිහායි කොටස අයත් රාගය හඳුනා ගනියි.
12. තිහායි වාදනය මගින් ස්වර ප්‍රස්තාරය අයත් තාලය තෝරයි
13. තිහායි සඳහා ගැලපෙන තාලය තෝරයි.
14. තබ්ලා අක්ෂර සංඛ්‍යාත්මකව සමාන වන තාල යුගලය නම් කරයි.
15. තනි අතින් සහ දෑතින් නිපදවෙන තබ්ලා අක්ෂර සමානවන තාල යුගලය හඳුනා ගනියි.
16. හින්දුස්ථානි සංගීතයට ආවේණික සංගීත භාණ්ඩ වෙන්කර හඳුනා ගනියි.
17. රාගධාරී ප්‍රබන්ධ විශේෂයන් සඳහා ප්‍රකාශිත පාරිභාෂික වචනාර්ථ හඳුනා ගනියි.
18. රාගාශ්‍රිත සරල ගීතයක් හඳුනාගැනීමට ඉවහල් වන විශේෂ ලක්ෂණයක් තෝරයි.
19. සරල ගීතයයන්හි පද රචකයන් හා තනු නිර්මාපකයින් පිළිබඳ අවබෝධය පෙන්වයි.
20. ජන ගී ආශ්‍රිත සරල ගී සඳහා පාදක වූ ජන නාදරටා පිළිබඳ අවබෝධය පෙන්වයි.
21. ආඝාතාත්මක හා අනාඝාතාත්මක ජන ගී වෙන්කර හඳුනා ගනියි.
22. දේශීය වන්නම් ගායනා සඳහා භාවිත අවනද්ධ භාණ්ඩ වෙන් කර හඳුනා ගනියි.



0003171

23. පැරණි නාඩගම් ගී තනු හා සමාන නව නාට්‍ය ගීතනු ඇතුළත් නව නාට්‍ය නම් කරයි.

24. නාඩගම් හා නූර්ති රංගනයන් ගේ සුවිශේෂී අංග වෙන් කර හඳුනා ගනියි.

25. කවි ආකෘති ලක්ෂණයට ලියැවී ඇති ගීත වෙන් කර හඳුනා ගනියි.

26. චිත්‍රපට සංගීත අධ්‍යක්ෂවරු නම් කරයි.

27. රේඛාව චිත්‍රපටයෙහි නිර්මාණකරුවන් නම් කරයි.

28. චිත්‍රපටයට අයත් ගීත වෙන්කර හඳුනා ගනියි.

29. ග්‍රැමෆෝන් ගී තනු පිළිබඳ අවබෝධය පෙන්වයි.

30. ලංකාවේ බෙංගාලි ගී තනු ව්‍යාප්ත වීමට දායක වූ සංගීතඥයින් නම් කරයි.

31. අපරදිග සංගීත ප්‍රස්තාරකරණය පිළිබඳ දැනුම පෙන්වයි.

32. අපරදිග සංගීත ප්‍රස්තාරකරණය පිළිබඳ දැනුම පෙන්වයි.

33. කෝඩ්ස් (Chords) වාදනය කළ නොහැකි බටහිර වාද්‍ය භාණ්ඩය තෝරයි.

34. බටහිර සංගීත ස්කේල පිළිබඳ දැනුම, අවබෝධය පෙන්වයි.

35. බටහිර සංගීත ස්කේල පිළිබඳ දැනුම, අවබෝධය පෙන්වයි.

36. පරිගණකය ආශ්‍රිතව සංගීතය සැකසීම පිළිබඳ අවබෝධය පෙන්වයි.

37. සංගීතය හා සම්බන්ධ තාක්ෂණික උපකරණ පිළිබඳ අවබෝධය පෙන්වයි.

38. තබ්ලාවේ භාවිත අවනද්ධාක්ෂර තෝරයි.

39. අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය පිළිබඳ දැනුම පෙන්වයි.

40. සමාන හැඩයෙන් යුත් අවනද්ධ භාණ්ඩ තෝරයි.

## 40 - සංගීතය පෙරදිග - ii

**අභිමතාර්ථ**

**1 වන ප්‍රශ්නය**

i. ස්වර සංගති ඇසුරෙන් රාගය හඳුනා ගනියි.

ii. ස්වර සංයෝජනය මගින් රාගය හඳුනා ගනියි.

iii. රාග ජාති සංකල්පය අනුව රාගය හඳුනා ගනියි.

iv. තානාලංකාර ආශ්‍රයෙන් රාගය හඳුනා ගනියි.

v. අපරදිග සිම්පනි පිළිබඳව දැනුම පෙන්වයි.

03070000188110024

vi. සින්දු වන්නම් පිළිබඳ දැනුම පෙන්වයි.

vii. දේශීය සරල සංගීතය පිළිබඳ දැනුම පෙන්වයි.

viii. දේශීය චිත්‍රපට සංගීතය පිළිබඳ දැනුම පෙන්වයි.

ix. ගුවන් විදුලි සංගීතය පිළිබඳව දැනුම පෙන්වයි.

x. කපිරිඤ්ඤා ගීත සඳහා යොදා ගනු ලබන තාල වාද්‍ය භාණ්ඩ හා එම ගීතවලට ගැලපෙන පෙරදිග තාල පිළිබඳ අවබෝධය පෙන්වයි.

**2 වන ප්‍රශ්නය**

i. විවිධ ස්වර සංගති ඇසුරෙන් අදාළ රාගය හඳුනා ගැනීමේ කුසලතා පෙන්වයි.

ii. විවිධ ස්වර සංගති මගින් ප්‍රකාශ කෙරෙන රාගයට අදාළ ඛ්‍යාල ගීත, වාදිත, ලක්ෂණ ගීත,සර්ගම් ප්‍රබන්ධ තාල සංකේත සහිතව ස්වර ප්‍රස්තාර කරයි.

iii. විවිධ රාගවලට අදාළ සංගති මගින් එම රාග වෙන්කර හඳුනා ගනියි.

**3 වන ප්‍රශ්නය**

i. රාග විස්තර අනුව අදාළ රාග හඳුනා ගනියි.

ii. රාගයක මධ්‍යලය ඛ්‍යාල ප්‍රබන්ධයක් ස්වර ප්‍රස්තාර කර ඊට අදාළ තානාලංකාර ලියා දක්වයි.

iii. තාල ඨේකා, මාත්‍රා විභාග හා තාල සංකේත සහිතව ප්‍රස්තාර කරයි.

**4 වන ප්‍රශ්නය**

i. ගැමි ගී නිර්මාණයට පාදක වූ හේතු සාධක ලියා දක්වයි.

ii. අනාඝාතාත්මක මෙහෙ ගීතවලට අයත් සුවිශේෂී ලක්ෂණ ලියා දක්වයි.

iii. විවිධ විරිත් අනුව රචනා වී ඇති ගී පාද ඒවායේ මාත්‍රා සංඛ්‍යාවන් අනුව හඳුන්වයි.

iv. ගෘහස්ථ ජන ක්‍රීඩා නම් කර, ගි පාදයක් ලියා දක්වා ඊට අදාළ තිත නම් කරයි.

**5 වන ප්‍රශ්නය**

i. සොකරි රංග ශෛලිය සඳහා යොදා ගනු ලබන අවනද්ධ භාණ්ඩ නම් කරයි.

ii. නාඩගම් සඳහා භාවිත කරන ලද අවනද්ධ වාද්‍ය භාණ්ඩය සහ නාඩගම් තාල නම් කරයි.

iii. නූර්ති සඳහා භාවිත කෙරෙන ස්වර වාද්‍ය භාණ්ඩ හා අවනද්ධ වාද්‍ය නම් කරයි.

iv. නාට්‍ය ගීපාද අනුව අදාළ නාට්‍යය සහ නිෂ්පාදකයා නම් කරයි.

**6 වන ප්‍රශ්නය**

i. අපරදිග සංගීත ස්වර ප්‍රස්තාරයක් පෙරදිග සංගීත ක්‍රමයට ලියා සුදුසු කෝඩ්ස් (Chords) යොදයි.

ii. පෙරදිග ස්වර ප්‍රස්තාරයට අනුරූප අපරදිග ස්වර ප්‍රස්තාර කොටස් නිවැරදිව ගලපයි.

**7 වන ප්‍රශ්නය**

i. තාරතාවය, විපුලතාවය, ධ්වනි ගුණය පිළිබඳ අවබෝධය සහිතව කරුණු ඉදිරිපත් කරයි.
ii. ඉන්දීය සංගීත ශිල්පීන් පිළිබඳ ජීවන තොරතුරු හා වාදන කෞශල්‍යයන් ගොනු කරයි.

iii. සංගීත පටිගත කිරීමට යොදා ගන්නා මෘදුකාංග නම් කර පටිගත කිරීමේ ක්‍රියාවලිය පෙළ ගස්වයි.

iv. ආසාතාත්මක ජන ගීවල සුවිශේෂී ලක්ෂණ හා ආසාතාත්මක බැති ගී පාද ලියා දක්වයි.

v. නිර්දේශිත රාගයක් ඇසුරෙන් පද රචනාවට සුදුසු තනුවක් නිර්මාණය කරයි.

0207D00188110024

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**40 | S | I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)**
**General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)**

**සංගීතය (පෙරදිග) I, II**
**சங்கீதம் (கீழைத்தேய) I, II**
**Music (Oriental) I, II**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## සංගීතය (පෙරදිග) I

*උපදෙස්:*

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** සගමරි, රිමපග, _ _ _ _ ආකෘතිය අනුව යෙදෙන ආරෝහණ ස්වර අභ්‍යාසයේ ඊළඟට යෙදෙන හිස් තැනට අදාළ ස්වර හතර තෝරන්න.
(1) ග ම ධ ප (2) ග ධ ප ම (3) ග ප ධ ම (4) ග ධ ම ප

**2.** ශුද්ධ ස්වර පමණක් යෙදෙන රාග යුගලය අයත් වරණය තෝරන්න.
(1) කාෆි – යමන් (2) යමන් – භූපාලි (3) භූපාලි – බිලාවල් (4) බිලාවල් – යමන්

**3.** ගාන්ධාරය වාදී ලෙස හෝ සංවාදී ලෙස හෝ යොදා ගැනෙන රාග ඇතුළත් වරණය තෝරන්න.
(1) කාෆි, යමන්, භූපාලි
(2) යමන්, භූපාලි, බිලාවල්
(3) බිලාවල්, යමන්, භෛරවී
(4) භෛරවී, භූපාලි, යමන්

**4.** සම්පූර්ණ ජාතියට අයත් **නො වන** රාගය තෝරන්න.
(1) යමන් (2) කාෆි (3) භෛරවී (4) භූපාලි

**5.** ගාන සමය නිශ්චිත ව ම සමාන වන රාග දෙක සඳහන් වරණය තෝරන්න.
(1) යමන් – කාෆි (2) කාෆි – බිලාවල් (3) බිලාවල් – භූපාලි (4) භූපාලි – යමන්

**6.** ගාන්ධාරය සහ ධෛවතය යන ස්වර දෙකම විකෘති ව යෙදෙන රාගය තෝරන්න.
(1) කාෆි (2) යමන් (3) භෛරවී (4) භූපාලි

**7.** රාග අංගයක් ලෙස " ප ප ස් " වශයෙන් ස්වර සංගතිය යෙදෙන අවස්ථා පෙන්නුම් **නො කරන** රාගය තෝරන්න.
(1) යමන් (2) භූපාලි (3) බිලාවල් (4) කාෆි

**8.** ෂඩ්ජ ස්වරය **නො යෙදෙන** ලෙස (ෂඩ්ජයට පෙර හා පසු ස්වර සම්බන්ධ වන අයුරින්) රාග සංගති යෙදෙන රාගය තෝරන්න.
(1) බිලාවල් (2) භෛරවී (3) යමන් (4) කාෆි

**9.** අන්තරා කොටස්වල බොහෝ විට පංචම ස්වරය අත හැර සංගති භාවිත වන රාග දෙකක් ඇතුළත් වරණය තෝරන්න.
(1) භෛරවී – කාෆි (2) කාෆි – බිලාවල් (3) බිලාවල් – යමන් (4) යමන් – භෛරවී

**10.** කාෆි රාගයට නිර්දේශිත මුඛ්‍යාංගය පෙන්නුම් කෙරෙන වරණය තෝරන්න.

(1) සස, රිරි, ගුගු, සරිප  (2) සස, රිරි, ගුගු, මමප

(3) රිගු, රිම, ගුරි, සරිප  (4) රිනි, ධනි, පධ, මමප

● අංක **11** සහ **12** හි සඳහන් ප්‍රශ්න සඳහා පහත ස්වර ප්‍රස්තාරය ඇසුරින් පිළිතුරු සපයන්න.

| ස්– ධප ගප | ධනි ස්– ස්– ධප | ගප ධනි ස්– | ස්– ධප ගප ධනි | ස් |
|---|---|---|---|---|
| x | 2 | 0 | 3 | x |

**11.** ස්වර ප්‍රස්තාරයෙහි සඳහන් තිහායි කොටස අයත් රාගය වන්නේ කුමක් ද?

(1) භූපාලි  (2) බිලාවල්  (3) යමන්  (4) කාෆි

**12.** එම තිහායි කොටස යෙදී ඇත්තේ

(1) ජප්තාලයට අනුව ය.  (2) ත්‍රිතාලයට අනුව ය.

(3) දීප්චන්දි තාලයට අනුව ය.  (4) කෙහෙර්වා තාලයට අනුව ය.

**13.** ගෙනෙ තිට ධා– වශයෙන් යෙදෙන අවනද්ධාක්ෂර පෙළ තෙවරක් වැයීමෙන්, එක් ආවර්තයක් තුළ තිහායි කොටසක් ලෙස යොදා ගත හැකි වන්නේ කුමන තාලයට අනුව ද?

(1) ජප් තාලයට  (2) දාදරා තාලයට  (3) කෙහෙර්වා තාලයට  (4) දීප්චන්දි තාලයට

**14.** 'ත' සහ 'තිං' යන අවනද්ධාක්ෂර දෙවර්ගය ම ඇතුළත් තාල යුගලයක් සහිත වරණය තෝරන්න.

(1) දීප්චන්දි – ත්‍රිතාල්  (2) ත්‍රිතාල් – ජප්  (3) ජප්– දාදරා  (4) දාදරා – දීප්චන්දි

**15.** දැතින් ම උපදවන අවනද්ධාක්ෂර සංඛ්‍යාව සහ තනි අතින් උපදවන අවනද්ධාක්ෂර සංඛ්‍යාව සමාන වන තාලයකි, දාදරා. ඒ සඳහා තවත් නිදර්ශනයක් ලෙස පෙන්නුම් කළ හැකි තාලයකි,

(1) කෙහෙර්වා.  (2) දීප්චන්දි.  (3) ජප්.  (4) ත්‍රිතාල්.

**16.** පහත වාද්‍ය භාණ්ඩ අතුරින් හින්දුස්තානි සංගීතයට ආවේණික භාණ්ඩය තෝරන්න.

(1) සිතාරය  (2) ගිටාරය

(3) පියානෝව  (4) පන්තේරුව

**17.** ස්වර මාලිකා නමින් හඳුන්වනු ලබන රාගධාරී ප්‍රබන්ධ විශේෂය වන්නේ කුමක් ද?

(1) ධූන්  (2) ගත්  (3) ඛ්‍යාල්  (4) සර්ගම්

**18.** රාගාශ්‍රිත සරල ගී හඳුනා ගැනීමට ප්‍රධාන වශයෙන් ඉවහල් වනුයේ, නාද මාලාවෙන් පිළිබිඹු වන

(1) ස්වර විශේෂයන් ය.  (2) ස්වර සංගතීන් ය.

(3) ස්වර සීමාවන් ය.  (4) ස්වර පරාසයන් ය.

**19.** ජන ගී තනු නාද රටා ආශ්‍රිත ව නිර්මාණය වූ "මල්සරා බැල්ම හෙලා" යන සරල ගීතයේ පදරචනය හා තනුව නිර්මාණය කරන ලද්දේ

(1) ලයනල් රන්වල විසින් ය.  (2) සී. ද. එස්. කුලතිලක විසින් ය.

(3) රෝහණ බැද්දගේ විසින් ය.  (4) වික්ටර් රත්නායක විසින් ය.

**20.** උකුසා වන්නමේ නාද මාලාව පාදක කර ගනිමින්, නිර්මාණය වූ සරල ගීතයට අදාළ ගී පාදය තෝරන්න.

(1) සැඳෑ කළුවර කුරගගා විත්

(2) රුක් අත්තන මල මුදුනේ

(3) තෙදිනි විරාජ කඳ දෙව්රාජ

(4) ආදරයේ උල්පත වූ අම්මා

**21.** පහත දැක්වෙන ගී පාද අයත් ජන ගී අතුරෙන්, අනාඝාතාත්මක ව ගැයෙන ගීතයට අදාළ ගී පාදය තෝරන්න.

(1) බුද්ධං සරණේ සිරස දරා ගෙන  (2) දොඩම් කපාලා ඇඹුල් තනාලා

(3) සීත ගඟුලෙ දී ඇඟ පේවෙනවා  (4) කළුවන් කළුරුවයි මංගෝ දිලිසෙනවා

0107000188110024

22. ● සේවිත පාද සරෝරුහ සන්විතයෙන් ඉකා
● කොහොව් යනා හඬ නගනා මියුරු මනා දන සවනා

ඉහත වන්නම් ගායනය සඳහා සාම්ප්‍රදායික ව යොදා ගනු ලබන ප්‍රධාන අවනද්ධ භාණ්ඩ පිළිවෙළින් දක්වෙන වරණය තෝරන්න.

(1) දවුල සහ ගැටබෙරය (2) ගැටබෙරය සහ දවුල
(3) පහතරට බෙරය සහ දවුල (4) දවුල සහ පහතරට බෙරය

23. පැරණි නාඩගම් ගීතයක් වන "මෙමගින් ගිය රුසිරු එ තරුණා" නම් ගී තනුවට සමාන ලෙස නිර්මාණය වී ඇති "රුසිරු ළඳුනි" නම් ගීතය ඇතුළත් නව නාට්‍ය වනුයේ

(1) මනමේ ය. (2) සිංහබාහු ය.
(3) කාලගෝල ය. (4) පේමතෝ ජායතී සෝකෝ ය.

24. නාඩගම් ගීතවල උරුවටුව සුවිශේෂී අංගයක් වන අතර නූර්ති ගීතවල යෙදෙන සුවිශේෂී අංගයක් වන්නේ,

(1) තෝඩායමයි. (2) ඉන්නිසයයි.
(3) දොහොරාවයි. (4) තර්ගයයි.

25. කවි ආකෘතිය අනුව පද යෙදී ඇති ගීතයක් සඳහා නිදසුනක් ලෙස සැලකිය හැකි ගීතය අයත් ගී පාදය තෝරන්න.

(1) පියාණනි මා නැවත උපන්නොත් (2) දුනුකෙයියා මලක් වගේ දුරට පෙනෙනවා
(3) බුද්ධානුභාවේන සිත් නෙත් පහන් වී (4) ආදරයේ උල්පත වූ අම්මා

26. සුප්‍රසිද්ධ ඉන්දීය චිත්‍රපට සංගීත අධ්‍යක්ෂවරයෙකු වන්නේ මින් කවුරුන් ද?

(1) ඒ.ආර්. රහුමාන් (2) ඒ.ජේ. කරීම්
(3) විශ්වනාත් ලව්ජි (4) ඒ.එම්.යූ. රාජ්

27. රේඛාව චිත්‍රපටය සඳහා දායක වූ ගී පද හා ගී තනු නිර්මාණකරුවන්ගේ නම් සඳහන් වරණය තෝරන්න.

(1) හර්බට් ඇම්. සෙනෙවිරත්න සහ ටී.එම්. ලතීෆ්
(2) සී.කේ.ඩී. සෙනෙවිරත්න සහ සිසිර සේනාරත්න
(3) මර්සලින් ජයකොඩි පියතුමා සහ සුනිල් සාන්ත
(4) ආනන්ද සමරකෝන් සහ බී.එස්. පෙරේරා

28. "ගලන ගඟකි ජීවිතේ, පිපී පිපී රේණු නටන ..." යන ගීත ඇතුළත් චිත්‍රපටය වන්නේ,

(1) සැඩ සුළං ය. (2) ගැටවරයෝ ය. (3) සත් සමුදුර ය. (4) රන් මුතු දූව ය.

29. හින්දි ගී තනු අනුකරණයෙන් නිර්මාණය වී ඇති ග්‍රැමෆෝන් ගීතයක් සඳහන් වරණය තෝරන්න.

(1) පිට දීප දේශ ජය ගත්තා (2) දුල් සල් වනේ ලකල්
(3) මව් පියෝ ආදී (4) එන්ඩ ද මැණිකේ

30. බෙංගාලි ජන ගී නාද මාලා ආශ්‍රයෙන් ගීත නිර්මාණය කළ සුවිශේෂී සංගීතඥයා කවුරුන් ද?

(1) ආනන්ද සමරකෝන් (2) සරත් දසනායක
(3) ප්‍රේමසිරි කේමදාස (4) ලයනල් රන්වල

31. බටහිර සංගීතයේ Key Signature නම් සංකේතයෙන් අදහස් කෙරෙනුයේ

(1) අපරදිග සංගීත ප්‍රස්තාරයක ඇතුළත් විරාම ලකුණු වේ.
(2) අපරදිග සංගීත ප්‍රස්තාරයේ තාල ලකුණු වේ.
(3) අපරදිග සංගීත ප්‍රස්තාරයේ ස්කේලය හැඟවීම වේ.
(4) මන්ද්‍ර, මධ්‍ය, උච්ච වශයෙන් අපරදිග සංගීත ප්‍රස්තාරය අයත් සප්තකය නම් කිරීම වේ.

32. අපරදිග සංගීත ප්‍රස්තාරයක මාත්‍රා දෙකක් නිශ්ශබ්ද බව පෙන්නුම් කිරීම සඳහා යොදා ගනු ලබන සංකේතය හැඳින්වෙනුයේ

(1) සෙමිබ්‍රිව් රෙස්ට් නමින් ය. (2) මිනිම් රෙස්ට් නමින් ය.
(3) ක්‍රොචට් රෙස්ට් නමින් ය. (4) ක්වේවර් රෙස්ට් නමින් ය.

**33.** බටහිර ස්වර සංඝාත (chords) වාදනය **නො වන** වාද්‍ය භාණ්ඩය තෝරන්න.
(1) කොන්සර්ට් ෆ්ලූට්　(2) මැන්ඩලින්　(3) පියානෝ　(4) ගිටාර්

**34.** F මේජර් ස්කේලයට අයත් ෆ්ලැට් (Flat) ස්වර සංඛ්‍යාව
(1) 1 කි.　(2) 2 කි.　(3) 3 කි.　(4) 4 කි.

**35.** D මේජර් ස්කේලයට අයත් ෂාප් (Sharp) ස්වර සංඛ්‍යාව
(1) 1 කි.　(2) 2 කි.　(3) 3 කි.　(4) 4 කි.

**36.** සාම්ප්‍රදායික භාණ්ඩ භාවිතයෙන් තොරව, පරිගණකය හා යතුරු පුවරුව ආශ්‍රයෙන් විද්‍යුත් ක්‍රමයට සංගීතය සැකසීමේ තාක්ෂණය හඳුන් වන්නේ
(1) Wikipedia නමිනි.　(2) MIDI නමිනි.
(3) Encyclopedia නමිනි.　(4) Encarta නමිනි.

**37.** සංගීතය ගබඩා කර ගත හැකි උපකරණ අතුරෙන් නවතම තාක්ෂණික උපකරණය ලෙස සැලකිය හැක්කේ,
(1) ඩිජිටල් ඕඩියෝ ටේප් (Digital Audio Tape) ය.
(2) පූල් ටේප් (Pool Tape) ය.
(3) ඕඩියෝ කැසට් ටේප් (Audio Cassette Tape) ය.
(4) USB ෆ්ලෑෂ් ඩ්‍රයිව් (USB Flash Drive) ය.

**38.** තබ්ලා වාදනයේ දී දහිනාවෙහි (දායාං) සයාහි කොටස භාවිතයෙන් උපදවනු ලබන අවනද්ධාක්ෂරය තෝරන්න.
(1) ති　(2) න　(3) ග　(4) ක

**39.** දෑත ම භාවිත කරමින් කෝඩ්ස් සහ ගීතයේ නාද මාලාව එක වර වාදනය සිදු කෙරෙන බැලෝ සහිත වාද්‍ය භාණ්ඩය වන්නේ
(1) පියානෝවයි.　(2) මවුත් ඕගනයයි.
(3) එකෝඩියනයයි.　(4) මෙලෝඩිකාවයි.

**40.** සමාන හැඩයකින් යුත් භාණ්ඩ යුගලයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) ගැට බෙරය සහ උඩැක්කිය　(2) තම්මැට්ටම සහ ඩෝලය
(3) දවුල සහ මද්දලය　(4) මද්දලය සහ මෘදංගය

* *

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024(2025)
## க.பொ.த. (சா.தர)ப் பரீட்சை - 2024(2025)

විෂය අංකය / பாட இலக்கம் : **40**

විෂය / பாடம் : පෙරදිග සංගීතය

### I පත්‍රය - පිළිතුරු
### I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 2 | 21. | 4 | 31. | 3 |
| 02. | 3 | 12. | 3 | 22. | 3 | 32. | 2 |
| 03. | 2 | 13. | 3 | 23. | 1 | 33. | 1 |
| 04. | 4 | 14. | 1 | 24. | 3 | 34. | 1 |
| 05. | 4 | 15. | 3 | 25. | 2 | 35. | 2 |
| 06. | 3 | 16. | 1 | 26. | 1 | 36. | 2 |
| 07. | 3 | 17. | 4 | 27. | 3 | 37. | 4 |
| 08. | 3 | 18. | 2 | 28. | 4 | 38. | 1 |
| 09. | 4 | 19. | 3 | 29. | 2 | 39. | 3 |
| 10. | 2 | 20. | 2 | 30. | 1 | 40. | 4 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை : $\frac{25}{40}$

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி : $\frac{25}{40}$



0003166

**1.** අංක (i) සිට (iv) තෙක් අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(i) ග රි නි රි ස, ප රි ස , ලෙස යෙදෙන ස්වර සංගති අයත් වන රාගය නම් කරන්න.

(ii) විකෘති ස්වර හතරක් යෙදෙන නිර්දේශිත රාගය නම් කරන්න.

(iii) ඖඩව ජාති රාගයක යෙදෙන අනුවාදී ස්වර ගණන කීය ද?

(iv) | සරි ප – මප ධනි | ධප මප නිනි ස – | මෙම තානාලංකාරය අයත් නිර්දේශිත රාගය නම් කරන්න.

- අංක (v) සිට (viii) තෙක් ඇති ප්‍රශ්න යටතේ යෙදී ඇති හිස් තැන් සඳහා නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(v) කෝරල් සිම්ෆනිය ...................... නමැති සංගීතඥයා විසින් නිර්මාණය කර ඇත.

(vi) පහත රට සින්දු වන්නම කොටස් හතරකට බෙදී ඇත්තේ බෙර පදය, තානම, කවිය හා .................... වශයෙනි.

(vii) "නැති බැරි මොහොතක පිහිටට එන්නේ" යනාදි වශයෙන් පද යෙදෙන සරල ගීතය ගායනා කරන ලද්දේ .............................. සූරීන් විසිනි.

(viii) එක්ටැම්ගේ චිත්‍රපටියේ එන 'උන්මාද සිතුවම්' ගීතයට ගී තනු නිර්මාණය කර සංගීත අධ්‍යක්ෂණය කර ඇත්තේ ....................... සූරීන් විසිනි. (ලකුණු 01 × 08 = 08 යි)

- අංක (ix) සහ (x) ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ප්‍රශ්න අංකය ද සමග ඔබේ පිළිතුරු පත්‍රයෙහි ලියන්න.

(ix) මුල් යුගයේ ගුවන් විදුලි සරල ගී ලෙස සලකනු ලබන "ඕලු පිපීලා වෙල ලෙල දෙනවා" ගීතය (a) ......................... සූරීන් විසින් ද "කරුණා නදියේ පැද යාමු" ගීතය (b) ............................ සූරීන් විසින් ද නිර්මාණය කරන ලදී.

(x) 'තැර ඉස්ති තැර' වශයෙන් පද යෙදෙන ගීතය ගායනයේ දී තාල වාදනය සඳහා බොංගෝ, ටැම්බරින් හා (a) ......................... යනාදි භාණ්ඩ යොදා ගෙන ඇති අතර, එම ගීතය සඳහා හින්දුස්තානි තාලයක් වන (b) ...................... තාලය ද සුදුසු වේ.

(ලකුණු 02 × 02 = 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

1

i. යමන් රාගය

ii. භෛරවී රාගය

iii. තුනකි.

iv. කාෆි රාගය

v. ලුඩ්විග් වැන් බීතෝවන්

vi. ඉරට්ටිය

vii. රෝහණ වීරසිංහ

viii. සරත් දසනායක (ල. 01 × 08 =) - ලකුණු 08

ix. (a) සුනිල් සාන්ත

(b) ආනන්ද සමරකෝන්

x. (a) රබාන, මර්කාස්, කොංගෝ

(b) බෙම්බෝ, හින්ච් (ල. 02 × 02 =) - ලකුණු 04

**මුලු ලකුණු 12**

2. (i) පහත A, B, C සහ D අක්ෂර යටතෙහි සඳහන් රාග සංගතිවලින් පිළිබිඹු වන හින්දුස්තානි රාග හතර තෝරා අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග වෙන වෙන ම ලියන්න.

A – ස,රිගුරිමගුරිස

B – මගුසරිස,ධුනිස

C – ගරිසධ,ධසරිග

D – මගමරි, ගමරිස (ලකුණු 04 යි)

(ii) ඉහත සංගතිවලින් පිළිබිඹු වන නිර්දේශිත රාග හතරෙන්, ඔබ කැමති රාගයකින්, **පහත එක් වර්ගයකට අදාළ ව ස්ථායි කොටසෙහි** ස්වර ප්‍රස්තාරය නියමිත තාල සංකේත ද සහිත ව ලියන්න.

- මධ්‍යලය ඛ්‍යාල් ගීතය
- මධ්‍යලය ගත් වාදිතය
- රාග ලක්ෂණ ගීතය
- සර්ගම් ප්‍රබන්ධය (ලකුණු 05 යි)

(iii) ඉහත A, B, C හා D ස්වර සංගතිවලට අදාළ ව (ii) කොටසට පිළිතුරු ලිවීම සඳහා තෝරා ගත් රාගය හැර ඉතිරි රාග තුනෙහි **අන්තරා කොටස් සඳහා** අදාළ රාග සංගති **තුනක්** වෙන වෙන ම අදාළ රාගයේ නම ද සහිත ව ලියා දක්වන්න. (ලකුණු 03 යි)

**(මුළු ලකුණු 12 යි)**

i.

A - කාෆි රාගය

B - භෛරවි රාගය

C - භූපාලි රාගය

D - බිලාවල් රාගය

එක් නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු 1 බැගින් (1×4) = ලකුණු 04

ii. තෝරාගත් රාගයෙහි ස්ථායි කොටස

- නිවැරදි ස්වර ප්‍රස්තාරයේ එක් ආවර්ථයකට ලකුණු 02 බැගින් ආවර්ථ දෙකක් සඳහා (2×2) = ලකුණු 04
- තාල සංකේත නිවැරදිව යොදා තිබීම සඳහා ලකුණු 01

ලකුණු 05

iii. රාග තුනකට අදාළව රාග සංගති (අන්තරා) තුනක් ලිවීම. එක් සංගතියකට

එක් ලකුණ බැගින් (1×3) = ලකුණු 03

**මුලු ලකුණු 12**

අන්තරා සංගති සඳහා උදාහරණ

| **කාෆි රාගය** | **භෛරවී රාගය** | **භූපාලි රාගය** | **බිලාවල් රාගය** |
|---|---|---|---|
| මමපධනිනිස් | ධමධනිස් | පධස්ධප | ධනිස්රි්ස් |
| මමපපනිනිස් | පධනිස් | පපස්ධප | පධනිස් |
| පප ස් නිධප | ස්රි්නිධප | ධධස්රි්ග්රි්ස් | පධස්නිධප |
| මපනිනිස් | ධනිස්රි්ග්රි්ස් | ග්රි්ස්ධස් | ස්ග්ම්රි්ස් |
| පධනිස් | පධනිධප | ධස්ධරි්ස් | ස්රි්ස්නිධ |
| මපධනිධප | නිස්රි්නිස්ධ | පධස්රි්ග්රි්ස් | ධනිස්ධප |
| ස්රි්ග්රි්ස් | ස්ධපධමප | පධප ස්ධ | ස්නිධප |
| ස්නිධප | ස්නිධප | ස්ධප | ගපධනිස් |

3. (i) පහත A, B, C, D සහ E අක්ෂර යටතෙහි සඳහන් කරුණුවලින් පිළිබිඹු වන නිර්දේශිත රාග පහ තෝරා අදාළ ඉංග්‍රීසි අක්ෂරය ද සහිත ව නම් කරන්න.

A – සියලුම ස්වර ශුද්ධ ව යෙදෙන කල්‍යාණ මේලගත රාගයකි.

B – සියලුම ස්වර ශුද්ධ ව යෙදෙන උදය කාලයේ ගැයෙන රාගයකි.

C – චල ස්වර පහෙන් එක් ස්වරයක් පමණක් ප්‍රකෘති ව යෙදෙන රාගයකි.

D – අචල ස්වර වාදී සහ සංවාදී ලෙස යෙදෙන රාගයකි.

E – ගාන්ධාරය සහ නිෂාදය පිළිවෙළින් වාදී සහ සංවාදී ලෙස යෙදෙන රාගයකි. (ලකුණු 05 යි)

(ii) ඉහත A, B, C, D සහ E කරුණුවලින් පිළිබිඹු වන රාග පහෙන් **කැමති රාගයක් තෝරා ගෙන** මධ්‍යලය, ඛ්‍යාල් ප්‍රබන්ධයක අන්තරා කොටසෙහි පළමු පාදය (එක් ආවර්තයකට අනුව) ස්වර ප්‍රස්තාර කර, එම රාගයට අදාළ ව **මාත්‍රා 8කට නො අඩු තානාලංකාර දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) ජප්තාලයෙහි ඨේකාව නියමිත මාත්‍රා විභාග අනුව තාල සංකේත ද සහිත ව සමලයෙන් යුතු ව ප්‍රස්තාර කරන්න. (ලකුණු 03 යි)

**(මුළු ලකුණු 12 යි)**

i. නිර්දේශිත රාග පහ නිවැරදිව තෝරා, අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග

නම් කිරීමට (ල.1×5) ලකුණු 05

ii.තෝරා ගත් රාගයෙහි ඛ්‍යාල් ප්‍රබන්ධයක අන්තරා කොටසෙහි

පළමු පාදය ස්වර ප්‍රස්තාර කිරීමට ( විභාගයකට ලකුණු ½ බැගින්) ලකුණු 02

- එම රාගයට අදාළව මාත්‍රා 8 කට නොඅඩු තානාලංකාර දෙකක් නිවැරදිව ලිවීමට

(ල.1×2) - ලකුණු 02

iii. ජප් තාලයෙහි ඨේකාව මාත්‍රා, විභාග, තාල සංකේත ද සහිතව

නිවැරදිව සම ලයෙන් ප්‍රස්තාර කිරීම

- ඨේකාව නිවැරදිව ලිවීමට - ල.02 (විභාගයකට ලකුණු ½ බැගින්)
- තාල සංකේත නිවැරදිව ලකුණු කිරීමට - ල.01

ලකුණු 03

**මුළු ලකුණු 12**

i.

| | |
|---|---|
| A | භූපාලි රාගය |
| B | බිලාවල් රාගය |
| C | භෛරවි රාගය |
| D | කාෆි රාගය |
| E | යමන් රාගය |

ii.තෝරාගත් මධ්‍යලය ඛ්‍යාල් ප්‍රබන්ධයක අන්තරා කොටසෙහි පළමු පාදය (එක් ආවර්ථයකට අනුව) ස්වර ප්‍රස්තාර කර එම රාගයට අදාළව මාත්‍රා 08 කට නොඅඩු තානාලංකාර දෙකක් ලිවීම.

iii. ජප් තාලය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
| ධී | නා | ධී | ධී | නා | තී | නා | ධී | ධී | නා |
| × | | 2 | | | 0 | | 3 | | |
| ධිං | නා | ධිං | ධිං | නා | තිං | නා | ධිං | ධිං | නා |

(මේ ලෙසද, අවනද්ධ අක්ෂර යෙදී තිබිය හැකිය)



0003170

4. (i) ගැමි ගී නිර්මාණයට පාදක වූ හේතු සාධක **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) අනාඝාතාත්මක මෙහෙ ගීවල සුවිශේෂ ලක්ෂණ **තුනක්** ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(iii) විවිධ විරිත් අනුව රචනා වී ඇති ගුත්තිල කාව්‍යයේ එන පහත සඳහන් ගී පාද, මාත්‍රා අනුව නම් කරන ආකාරය වරහන් තුළින් තෝරා ලියන්න.
(දසමත් පැදි, දොළොස්මත් පැදි, සොළොස්මත් පැදි, දසඅටමත් පැදි, විසිඅටමත් පැදි)

- මනමත් කරවන දනමුළු දෙරණා
- රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙල දිදී විදුලිය පබා
- රැගත් සුරා පිරූ විතින් (ලකුණු 03 යි)

(iv) සිංහල අලුත් අවුරුදු සමයේ දී කෙරෙන ක්‍රීඩා අතුරෙන් ගෘහස්ත ව කෙරෙන ක්‍රීඩාවක් නම් කර, එයට අදාළ ගී පාදයක් පද ප්‍රස්තාර කර, එහි තිත ද නම් කරන්න. (ලකුණු 03 යි)

**(මුළු ලකුණු 12 යි)**

i. ගැමි ගී නිර්මාණයට පාදක වූ හේතු සාධක තුනක් ලිවීමට (ල.1×3) - ලකුණු 03

ii. අනාඝාතාත්මක මෙහෙ ගී වල සුවිශේෂ ලක්ෂණ තුනක් ලිවීමට (ල.1×3) - ලකුණු 03

iii. වරහන් තුළ දදී ඇති යෙදුම් අදාළ ගී පාද සමග නිවැරදිව ගලපා තිබීම.
(ල.1×3) - ලකුණු 03

iv. සිංහල අලුත් අවුරුදු සමයේ දී ගෘහස්ථව කෙරෙන

- ක්‍රීඩාවක් නම් කිරීමට - ලකුණු 01
- අදාළ ගී පාදයක් නිවැරදිව පද ප්‍රස්තාර කිරීමට - ලකුණු 01
- ගී පාදයට අදාළ තිත නම් කිරීමට - ලකුණු 01

} ලකුණු 03

**මුළු ලකුණු 12**

i.

- වෘත්තීන් අනුව ගොඩ නැගුණු ගී
- ඇදහිලි හා විශ්වාසය අනුව ගොඩ නැගුණු ගී
- විනෝදාස්වාදය හා සමාජ අවශ්‍යතා අනුව ගොඩ නැගුණු ගී

ii. අනාඝාතාත්මක මෙහෙ ගීවල සුවිශේෂි ලක්ෂණඃ-

- ඒකල ගායනයට සුදුසු වීම.
- ගායකයාගේ අභිමතය පරිදි අදාළ තැන්හි යති පිහිටුවා ගැයීමට හැකිවීම.
- රිද්මයක් තිබුනද, විභාග අනුව ප්‍රස්තාර කළ නොහැකි වීම.
- ගායනයේ දී ආඝාත තැබීමට නොහැකි වීම.
- ගීතයේ රිද්මය අදාළ කාර්යය හා බැඳි පැවතීම.
- ගී පාද හතරෙහි මත් කැටිවීම හා ආඝාත ලක්ෂණ විවිධ වීම.

යනාදි කරුණු යටතේ නිවැරදි කරුණු තුනක් ගොනු කර ඇත්නම් ලකුණු 03 කි.

iii.

- මන මත් කරවන දන මුළු දෙරනා - සොළොස්මත් පැදි
- රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙල දිදී විදුලිය පබා - විසිඅටමත් පැදි
- රැගත් සුරා පිරූ විතින් - දොළොස්මත් පැදි

iv. ඔළිඳ කෙළියට අදාළ ඕනෑම ගීතයක ගී පාදයක් පද ප්‍රස්තාර කර අදාළ තිත නම් කිරීම.

5. (i) සොකරි රංග ශෛලිය සඳහා යොදා ගනු ලබන අවනද්ධ වාද්‍ය භාණ්ඩ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) නාඩගම් සඳහා භාවිත කරන ලද අවනද්ධ වාද්‍ය භාණ්ඩය සහ නාඩගම් තාලයක් නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) නුර්ති සඳහා භාවිත කෙරෙන ස්වර වාද්‍ය භාණ්ඩ **දෙකක්** හා අවනද්ධ වාද්‍ය භාණ්ඩයක් නම් කරන්න. (ලකුණු 03 යි)

(iv) පහත දැක්වෙනුයේ මෙරට නව නාට්‍ය ගී පාද ඇතුළත් අසම්පූර්ණ වගුවකි. එම ගීත අයත් වන නාට්‍යවල නම් සහ එම නාට්‍ය නිෂ්පාදකයින්ගේ නම්, අදාළ ඉංග්‍රීසි අක්ෂරය සමග ලියන්න.

| නව නාට්‍ය ගී පාද | නව නාට්‍යය | නාට්‍ය නිෂ්පාදක |
|---|---|---|
| මෑ වේ මං දුටු කොමල ලියා | (a) .............................. | එදිරිවීර සරච්චන්ද්‍ර |
| අම්බරයේ සඳ සේ දිලේ | (b) .............................. | (d) .............................. |
| විගුරට නරනිඳු දඹදිව පරසිඳු | (c) .............................. | (e) .............................. |

(ලකුණු 05 යි)

**(මුළු ලකුණු 12 යි)**

i. සොකරි රංග ශෛලියට යොදාගනු ලබන අවනද්ධ වාද්‍ය භාණ්ඩ දෙක ලිවීමට - ලකුණු (ල.1×2) - ලකුණු 02

ii. නාඩගම් සඳහා භාවිත කරන ලද අවනද්ධ භාණ්ඩයේ නම ලිවීමට හා නාඩගම් තාලයක් නම් කිරීමට - ලකුණු (ල.1×2) - ලකුණු 02

iii. නුර්ති සඳහා භාවිත කරන ලද ස්වර වාද්‍ය භාණ්ඩ දෙකක් හා අවනද්ධ වාද්‍ය භාණ්ඩයක් ලිවීමට - ලකුණු (ල.1×3) - ලකුණු 03

iv. නව නාට්‍ය තුනෙහි නම් සහ එම නාට්‍ය නිෂ්පාදකයින් දෙදෙනාගේ නම් ලිවීමට - ලකුණු (ල.1×5) - ලකුණු 05

**මුළු ලකුණු 12**

i. ගැට බෙරය, දවුල, උඩැක්කිය

ii. මද්දලය

නාඩගම් තාල:-

පසන්, චාපු, තංගපාට, වඩිමෝඩි, තිර්ලානා, දිල්ලම් කීර්තනම්, තෙන්මොඩි, කෝබහාර පසන්, කඩිනම් පසන්

iii.

- ස්වර වාද්‍ය භාණ්ඩ:-

  සර්පිනාව, (හර්මෝනියම්) වයලින්, බටනලාව

- අවනද්ධ භාණ්ඩ:-
  තබ්ලාව, ඩොල්කිය

iv.

a) - මනමේ

b) - කාලගෝල

c) - සිංහබාහු

d) - පුන්‍යසේන ගුණසිංහ

e) - එදිරිවීර සරච්චන්ද්‍ර


6. (i) පහත දැක්වෙන අපරදිග සංගීත ප්‍රස්තාර කොටස පෙරදිග සංගීත ප්‍රස්තාර ක්‍රමයට පෙරළා නැවත ප්‍රස්තාර කර එහි එක් එක් විභාගයට සුදුසු කෝඩ්ස් (chords) විභාගවලට පහළින් සඳහන් කරන්න. (අපරදිග 'C' ස්වරය පෙරදිග 'ස' ස්වරයට සමාන යැයි සලකන්න.)



(ප්‍රස්තාරයේ එක් විභාගයකට ලකුණු ½ බැගින් විභාග 8 × ½) (ලකුණු 04 යි)

(කෝඩ්ස් නම් කිරීමට එක් විභාගයකට ලකුණු ½ බැගින් විභාග 8 × ½) (ලකුණු 04 යි)

(ii) පහත වගුවේ (i) කොටසෙහි A සිට D දක්වා ඇති පෙරදිග ස්වර ප්‍රස්තාර කොටස් සඳහා **ගැළපෙන** අපරදිග ප්‍රස්තාර කොටස්, (ii) කොටසින් තෝරා ගෙන ඊට හිමි අංකය අදාළ ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියෙන් ලියා දක්වන්න.

| (i) කොටස | (ii) කොටස |
|---|---|
| A ග – – ප – – / ධ – ස් නි ස් – | 1  |
| B + ගප නි ස්නි / රිරි ස් ගරි ස් | 2  |
| C ස් රි ස් නි ස් නි / ධ නි ධ ප – – | 3  |
| D ස ම – / – ම ග | 4  |

(ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

i. අපරදිග ප්‍රස්තාර කොටස පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කිරීමේ දී

- එක් විභාගයකට ලකුණු ½ බැගින් (½ × 8) - ලකුණු 04
- කෝඩ්ස් නම් කිරීමට එක් විභාගයකට ලකුණු ½ බැගින් (½ × 8) -ලකුණු 04

(එක් එක් විභාගයට අදාළ ස්වර සංකේත යොදා නොමැති අවස්ථාවන්හිදී ඊට අදාළ ලකුණු හිමි නොවේ)

ii. වගුවේ i කොටසේ සඳහන් ඉංග්‍රීසි අක්ෂරයන්ට අදාළ නිවැරදි පිළිතුරු ii කොටසින් තෝරා ඉංග්‍රීසි අක්ෂරය සහ අංකය සමග ගලපා ලිවීමට (ලකුණු 1 × 4) ලකුණු 04

**මුළු ලකුණු 12**

i.

| ස ග – | ම ධ – | නි – ප | ධ ස් – |

C F/Dm G/Em F/Am

| රි් නි ප | ස්ස් ධ ම | රි නි රි | ස – – |

G F G/$G^7$ C

ii.

| i. කොටස | ii. කොටස |
|---|---|
| A | 3 |
| B | 4 |
| C | 1 |
| D | 2 |

**මුළු ලකුණු 12**

7. පහත සඳහන් ප්‍රශ්න අතුරෙන් ප්‍රශ්න **තුනකට** පිළිතුරු සපයන්න.

(i) තාරතාවය, විපුලතාවය සහ ධ්වනි ගුණය යන නාදයේ ත්‍රිවිධ ගුණ, භාරතීය සංගීත සම්ප්‍රදාය අනුව නම් කර ඇති ආකාරය ලියා, ඉන් **එක්** ගුණයක් පිළිබඳ ව උදාහරණ දක්වමින් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) හරිප්‍රසාද් චෞරසියා, ශකීර් හුසේන් හා රවිශංකර් යන ඉන්දීය සංගීත ශිල්පීන් අතුරෙන් **එක් අයෙකුගේ** ජීවන තොරතුරු හා වාදන කෞශල්‍යය පිළිබඳ කෙටි ඇගයීමක් කරන්න.

(iii) Multi Track Recording සඳහා යොදා ගත හැකි මෘදුකාංග **දෙකක්** නම් කර, ගීතයක් පටිගත කළ හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) ආසාතාත්මක ජන ගීවල සුවිශේෂ ලක්ෂණ **දෙකක්** ලියා නිර්දේශිත ආසාතාත්මක බැති ගීයක පළමු හා දෙවන පාද ලියා දක්වන්න.

(v) පහත ගී පද රචනාව සඳහා සුදුසු නිර්දේශිත රාගයක් ඇසුරින් තනුවක් නිර්මාණය කර, ප්‍රස්තාර කරන්න.

"සිත් ගත් පැහැයෙන් දන මන බැන්දූ
වන කොමළිය සිරි ලක නම රැන්දූ"

**(ලකුණු 04 × 03 = 12 යි)**

i. නාදයේ ත්‍රිවිධ ගුණ භාරතීය සංගීත සම්ප්‍රදායට අනුව නම් කර ඇති ආකාරය

ලියා ඉන් එක් ගුණයක් උදාහරණ දක්වමින් කෙටියෙන් පැහැදිලි කිරීමට -ලකුණු 04

- නාදයේ ත්‍රිවිධ ගුණ නිවැරදිව ලියා ඇත්නම් - ල. 01
  (අවම වශයෙන් 2 ක් ලියා ඇත්නම් -ල. 0½)
- ඉන් එක් ගුණයක් අර්ථවත්ව විස්තර කිරීමට -ල. 02
- උදාහරණ දැක්වීමට -ල. 01 } ල. 03

ii. ඉන්දීය සංගීත ශිල්පියෙකුගේ ජීවන තොරතුරු හා වාදන කෞශල්‍යය ඇගයීමට - ලකුණු 04

- එක් සංගීතඥයෙකුගේ ජීවන තොරතුරු ලිවීමට ල. 02
- එම සංගීතඥයාගේ වාදන කෞශල්‍යය පිළිබඳ කෙටි ඇගයීමට ල. 02

iii. Multi Track Recording සඳහා යොදා ගත හැකි මෘදුකාංග දෙකක් නම් කිරීම සහ

පටිගත කළ හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කිරීමට - ලකුණු 04

- මෘදුකාංග 2 ක් නම් කිරීමට ල. 01
- පටිගත කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කිරීමට ල. 03

iv. ආසාතාත්මක ජන ගීවල සුවිශේෂ ලක්ෂණ දෙකක් ලියා ආසාතාත්මක බැති ගීයක

පළමු හා දෙවන පාද ලිවීමට - ලකුණු 04

- ආසාතාත්මක ජන ගීවල සුවිශේෂ ලක්ෂණ දෙක ලිවීමට ල. 02
- ආසාතාත්මක බැති ගීයක පළමු හා දෙවන පාද ලිවීමට (1×2) ල. 02

v. නිර්දේශිත රාගයක් ඇසුරෙන් ගී පද රචනාවකට තනුවක් නිර්මාණය කර ප්‍රස්තාර කිරීමට:-

- රාගය ආවරණය වීමට ල. 01
- නිර්මාණාත්මක භාවයට ල. 01
- තාලානුකූල බවට ල. 01
- පද ප්‍රස්තාරයේ ගැළපීමට ල. 01

- ලකුණු 04

**එක් කොටසකට ලකුණු 04 බැගින් කොටස් තුනට (4 X 3 = 12) මුළු ලකුණු 12**

i.

තාරතාවය - උච්ච නීච භේදය

විපුලතාවය - රූප භේදය

ධ්වනි ගුණය - ජාති භේදය

❖ තාරතාවය - උච්ච නීච භේදය

- හඬෙහි උස් පහත් භාවය වේ.
- හඬෙහි සංඛ්‍යාතයේ වෙනස වේ. (පිළිතුරට අදාළව උදාහරණ දක්වා තිබිය යුතුය)

❖ විපුලතාවය- රූප භේදය
- හඬෙහි සැර. (හඬෙහි අඩු වැඩි බව)
- හඬ පැතිරෙන ගුණය. (පිළිතුරට අදාළව උදාහරණ දක්වා තිබිය යුතුය)

❖ ධ්වණි ගුණය - ජාති භේදය
- හඬවල් එකිනෙකට වෙන්කොට හඳුනා ගැනීම. (පිළිතුරට අදාළව උදාහරණ දක්වා තිබිය යුතුය)

ii.

හරිප්‍රසාද් චෞරසියා

❖ ජීවන තොරතුරු

- උපත වර්ෂ 1938
- වයස අවුරුදු 15 දී, රාජා රාම් ගෙන් ගායනයද, බෝලානාත් ප්‍රසන්න ගෙන් බටනලා වාදනය ප්‍රගුණ කර ඇත.
- වර්ෂ 1960 දී අන්න පූර්ණා දේවී යටතේ වැඩිදුර සංගීතය හදාරා ඇත.
- වර්ෂ 2020 ඔක්. 18 දින ජීවිතක්ෂයට පත් විය.

❖ වාදන කෞශල්‍යය

- සංගීත දිවිය ගායකයෙකු ලෙස ඇරඹුවත් පසුව ප්‍රතිභාපූර්ණ බටනලා වාදන ශිල්පීයෙකු ලෙස ජනප්‍රිය විය.
- ඉන්දීය ගුවන් විදුලියේ වෘත්තීය වාදකයෙකු වීම.
- තම වාදන කුසලතාවය නිසා සම්මාන රැසක් දිනාගෙන ඇත.
- ඒ සඳහා 1992 දී පද්ම භූෂණ සම්මානයත්, 1994 දි යෂ් භාරතී සම්මානයත්, 2000 දී පද්ම භූෂණ සම්මානයත් ලබා ඇත.

ශකීර් හුසේන්

❖ ජීවන තොරතුරු
- වර්ෂ 1951 මාර්තු මස 9 වන දින ඉන්දියාවේ මහාරාෂ්ඨ ප්‍රදේශයේ මුම්බායි නගරයේ දී උපත ලැබීම.
- තම පියා වන **අල්ලා රක්ඛා** යටතේ තබ්ලා වාදනය ප්‍රගුණ කර ඇත.(පංජාබ් ගුරු කුලය)
- **උස්තාද් අහමද් ජාන් තිරක්වා** යටතේ ද තබ්ලා වාදනය ප්‍රගුණ කර ඇත.

❖ වාදන කෞශල්‍යය
විවිධ ගුරුකුල නියෝජනය කරන ශිල්පීන් සඳහා තබ්ලා වාදනයෙන් දායක වී ඇත.
- රවි ශංකර් - සිතාරය
- ශිව කුමාර් ශර්මා - සන්තූර්
- හරිප්‍රසාද් චෞරසියා - බටනලා
- ජෝන් මැක් ලෆ්ලින් - ගිටාරය
- මිකී හාට් - ඩ්‍රම්ස්



0003176

- ශාස්ත්‍රීය හා සමකාලීන සංගීත ක්‍රම ශිල්ප සඳහා ප්‍රවීනත්වයක් දැරුවෙකි.
- මොහු එසැන නිර්මාණ ඉදිරිපත් කිරීමෙහි ප්‍රවීනයෙකි.
- සමාඝාත භාණ්ඩ වාදනයෙහිලා ලෝක පූජිත සලකුණක් තැබූවෙකි.
- පංජාබ්, දිල්ලි, ෆාරුකාබාද්, වැනි තබ්ලා වාදන ගුරුකුල වලට අනුකූලව තබ්ලා වාදන ඉදිරිපත් කිරීමට නිපුනයෙකි.
- තබ්ලා වාදනය ඉතා ආකර්ශණීය ලෙස ප්‍රේක්ෂකයා වෙත ඉදිරිපත් කිරීමට විවිධ කතන්දර, තබ්ලා ප්‍රබන්ධ වලට ගලපා ඉදිරිපත් කිරීමේ පුරෝගාමියෙකි.
- නාද තාක්ෂණවේදය පිළිබඳ ඔහු හදාරා තිබීම නිසා වේදිකාව තුළ ඉතා මනරම් ලෙස තබ්ලාව තුලින් විවිධ ධ්වනියන් ඇති කරමින්, වැස්ස, දුම්රිය වැනි තේමාවන් ඔස්සේ වාදන ඉදිරිපත් කිරීමේ දී තාක්ෂණ දැනුමින් මනා ප්‍රයෝජන ගනිමින් සාර්ථක ඉදිරිපත් කිරීම් කළ ශිල්පියෙකි.

රවි ශංකර්

❖ ජීවන තොරතුරු

- වර්ෂ 1920 අප්‍රේල් 7 දින ඉන්දියාවේ වරණාසියේ දී උපත ලැබීම.
- සංගීතයට යොමුවීමට පෙර තම සොහොයුරු උදය ශංකර් ගේ නර්තන කණ්ඩායමේ නර්තන ශිල්පියෙකු ලෙස සම්බන්ධ වී ඇත.
- උස්තාද් අලව්දීන් ඛාන් යටතේ සිතාරය හදාරා ඇත.
- 2012 දෙසැම්බර් 11 දින මෙලොවින් සමුගෙන ඇත.

❖ වාදන කෞශල්‍යය

- ඔහු ගේ සංගීත දිවියේ නිරන්තර සිතාර් වාදන පුහුණුව අදටත් අන් අය හා සම කළ නොහැක.
- 1939 දී තම ප්‍රථම සිතාර් වාදනය ඉදිරිපත් කර ඇත.
- බටහිර වයලීන වාදක යෙහුදි මෙනුහින් සමග වයලීන - සිතාර් යුගල වාදන ප්‍රසිද්ධ ප්‍රසංග ඉදිරිපත් කර ඇත.
- ඉන්දියානු සංගීතය බටහිර ලෝකයට විවර කිරීමේ ගෞරවය හිමි වන්නේ රවි ශංකර් සංගීතඥයාට ය.
- සුප්‍රසිද්ධ බීට්ල්ස් සංගීත කණ්ඩායමේ ගිටාර් වාදන ශිල්පී ජෝර්ජ් හැරිසන් සමග එක්ව ප්‍රසංග පවත්වා ඇත.

iii. Multi Track Recording යොදා ගත හැකි මෘදුකාංගඃ-

- Cubase, Adobe Audition, FL Studio, Logic pro, Audacity, Reaper, Mix craft, Nuendo, Sonar, Garage Band

ගීතයක් පටිගත කළ හැකි ආකාරය

- අවශ්‍ය උපකරණ සපයා ගැනීම. (මයික්‍රෆෝන්, මිඩි කී බෝඩ්, සවුන්ඩ් කාඩ්, වෙනත් සංගීත භාණ්ඩ යනාදිය)
- පරිගණක තිරයේ අදාළ මෘදුකාංගය විවෘත කර ඔඩියෝ ට්‍රැක් නැතහොත් මිඩි ට්‍රැක් විවෘත කරගත යුතුය.
- සවුන්ඩ් කාඩ් සමග මයික්‍රෆෝන් සම්බන්ධ කර ගනිමින් මෘදුකාංගයේ ඇති රෙකෝඩින් බටන් එක ක්‍රියාත්මක කළ යුතු වේ.
- මයික්‍රෆෝන හරහා පැමිණෙන ගීතයට අදාළ සියළු සංගීත භාණ්ඩ වල ධ්වනි තරංග මෘදුකාංග මත පටිගත කර ගැනීම.
- බොහෝ විට සියළු සංගීත භාණ්ඩවල හඬ පටිගත කිරීමෙන් පසුව අවසානයේ කටහඬ පටිගත කරනු ලබයි.

iv. ආසාතාත්මක ජන ගීවල සුවිශේෂී ලක්ෂණ:-

- ආසාතය යෙදිය හැකි පරිදි පද සංයෝග වී තිබීම.
- සමූහ ගායනයට පහසු වීම.
- අත්තල තබමින් ගායනය කිරීමට හැකි වීම.
- විවිධ තිත් රූප අනුව නිර්මාණය වීම.
- කාර්යේ පවතින රිද්මයානුකූල බවට ගැළපෙන පරිදි පද හා නාද මාලා නිර්මාණය වී තිබීම.
- නිශ්චිත මාත්‍රා සංඛ්‍යාවකින් යුක්ත වීම.

❖ නිර්දේශිත ආසාතාත්මක බැති ගීයක පළමු හා දෙවන පාද නිවැරදිව ලියා තිබීම.

v. ගී පද රචනාව සඳහා නිර්දේශිත රාගයක් යොදාගෙන සුදුසු තනුවක් නිර්මාණය කර ස්වර හා පද ප්‍රස්තාර කිරීම